සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

## I කොටස

පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(01) "යාළුවේ, මම හත් අවුරුදු නියඟයකට අහු වෙලා <u>කොට්ට වෙලා</u>" ඉබ්බා කීවේ ය.

1. අධික ලෙස වේළිලා
2. ගලක් බවට පත්වෙලා
3. පොතු ගැලවිලා
4. කොට්ටයක් වෙලා

(02) ගොවිතැන් සඳහා මුදල් වියදම් කිරීම <u>ගඟට ඉනි කැපීමක්</u> යැයි ගොවියෝ පවසති.

1. ස්ථිර පැවැත්මක් ඇති දෙයකි.
2. උපරිම සතුටක් ලැබෙන දෙයකි.
3. නිෂ්ප්‍රයෝජන දෙයකි .
4. අධික ලාභයක් ලැබෙන දෙයකි.

(03) <u>වැරහැලි</u> දවටාගත් කරලිනා හාමි සිහිවිකල් වූවෙකු මෙන් පාරේ ගමන් කරන්නට විය.

1. සෝදා පිරිසිදු කරගත් ඇඳුම්
2. කිලිටි ඇඳුම්
3. දිරාගිය ඇඳුම්
4. අලුතින් මසන ලද ඇඳුම්

(04) බහු වචන නාම පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. කඳු , සිතිණි , ගස්
2. නැයා , පොත , කොළ
3. කළුගල් , ඔහු , පාර
4. ගොන්නු , පඳුරු , කණු

(05) මුලින් දී ඇති වචනයට **සමාන පදයක් දැකිය නොහැකි** පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මුහුද - සාගරය , සයුර , සමුදුර
2. ගෙය - විමන , නිවහන , නිවස
3. පක්ෂි - විහඟ , සියොත් , පුන්කුඹු
4. පැන් - ජලය , උදක , දිය

(06) පහත සඳහන් වැකියේ ඉරි ඇඳි පදවලට ගැළපෙන **විරුද්ධ පද** පිළිවෙළින් යෙදී ඇති වරණය වන්නේ,

“ශ්‍රී ලංකාව <u>සුලබව</u> දැකිය හැකි කුළු බඩු <u>අපනයනයෙන්</u> විශාල <u>ලාභයක්</u> ලබයි.”

1. අසීමිත - අනයනයෙන් - දියුණුවක්
2. අඩුවෙන් - නිර්යාත - මුදලක්
3. දුලභ - ආනයනය - අලාභයක්
4. වැඩියෙන් - විගමන - අලාභයක්

(07) පහත දැක්වෙන වචනවල ස්වර හා ව්‍යඤ්ජන නිසි ලෙස ගළපා ඇති වරණය වන්නේ,

1. තක්සලාව → ත් + අ + ක් + ස් + අ + ල් + අ + ව් + අ
2. අරලිය → අ + ර් + අ + ල් + ඉ + ය් + අ
3. මාලය → ම් + අ + ල් + අ + ය් + අ
4. කිරිල්ලී → ක් + ඉ + ර් + ඉ + ල් + අ + ල් + ර්

(08) "කුඩැල්ලා" යන වචනයේ සඳහන් පිල්ලම් නිවැරදි ලෙස යොදා ඇති පේළිය තෝරන්න.

1. දිගු ඇදපිල්ල , කෙටි පාපිල්ල , හල් කිරීම , ඇලපිල්ල
2. කෙටි පාපිල්ල , දිගු පාපිල්ල , හල් කිරීම , ඇලපිල්ල
3. දිගු පාපිල්ල , කෙටි ඇදපිල්ල , හල් කිරීම , ඇලපිල්ල
4. ඇලපිල්ල , හල් කිරීම , දිගු පාපිල්ල , කෙටි ඇදපිල්ල

(09) අතීත කාල ක්‍රියා පද පමණක් ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1. යයි - වචයි - බැලූහ - බලන්නේ ය
2. දුවමි - බැලුවා හ - ලියමි - යති
3. ලියුවෙමි - නැටුවෙහි - නැරඹුවෙහු - කැඩූහ
4. බලති - යන්නෙමි - යමි - ගියේ ය

(10) උක්ත පද හා අනුක්ත පද ප්‍රමාණය සමානව යෙදී ඇති පිළිතුර වන්නේ ,

1. ගවයා - ගස - ඇතැමෙක් - ගුරුතුමා
2. මිනිසුන් - කුරුල්ලන් - ගැමියෝ - වෛද්‍යවරු
3. මැස්සන් - ගම්වැසියෝ - කවීහු - තාරකාවෝ
4. කොටියා - රජවරුන් - ලේඛකයෙකු - උපාසිකාවන්

(11) ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

1. මා නිතර පොතපත කියවන්නෙමි.
2. අඹ මල් පිපී සුවඳ විහිදුවති.
3. නුඹ නිතර පාඩම් කරන්නෙහි.
4. ඔවුන් මහන්සියෙන් වැඩ කරති.

(12) පහත සඳහන් වාක්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

1. මධ්‍යම පුරුෂ වර්තමාන කාල වාක්‍යයකි.
2. ප්‍රථම පුරුෂ අනාගත කාල වාක්‍යයකි.
3. ප්‍රථම පුරුෂ වර්තමාන කාල වාක්‍යයකි.
4. ප්‍රථම පුරුෂ අතීත කාල වාක්‍යයකි.

- හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න

(13) ගිය ............ ඇතුන් ලවාවත් අද්දගන්න බෑ. (නුවණ / නුවන)

(14) ඩිංගිරි බණ්ඩා හේනේ කෙළවර ............ තැනුවේය. (පැල / පැළ)

(15) අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වචන ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ධමනි , මලළ , මිළ
2. ජනගහනය , ප්‍රස්ථාර , වියළි
3. වානිජ , පුස්තකාලය , වාර්ථාව
4. වර්ෂය , විස්මය , වලාකුළ

(16) පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය සහිත වැකිය තෝරන්න.

1. මැසින්න යන්නෙහි පුරුෂ ලිංග පදය මැස්සා යන්නයි.
2. නයා යන්නෙහි ස්ත්‍රී ලිංග පදය සැපින්න යන්නයි.
3. අශ්වයා යන්නෙහි ස්ත්‍රී ලිංග පදය වෙළඹ යන්නයි.
4. අලියා යන්නෙහි ස්ත්‍රී ලිංග පදය ඇතින්න යන්නයි.

(17) පහත සඳහන් වාක්‍යයේ සඤ්ඤක අක්ෂර සහිත වචන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.

"ගඟ දිය මත විසිරුණු සඳකිරණ අවට දර්ශනය මනහර කළ අතර , සියොතුහාමිගේ අඬහැරයෙන් කලබල වූ වවුලෝ ශබ්ද නැගූ හ."

1. විසිරුණු , අඬහැරය , සඳකිරණ
2. ගඟ , සඳකිරණ , අඬහැරය
3. දිය , විසිරුණු , සඳකිරණ
4. සඳකිරණ , දිය , ශබ්ද

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(18) නිවැරදි ලෙස විරාම ලකුණු යොදා ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1. මම ගෙදර පැමිණ මුහුණ සෝදාගෙන, කෑම කෑවෙමි.
2. ඔබේ දරුවා පළමු වරම උසස් ලෙස සමත් වේවා !
3. බොහොම ඉක්මනට ආවා නේ ද? විමලා කීවා ය.
4. "මම ආයිත් කාපන් පුතේ වැනි නවකතා ලියන්නෙ නම් නෑ"යි ලේඛකයා පැවසී ය.

(19) පහත සඳහන් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු විශේෂණ පද යොදන්න.

අපි ........... ගුරුවරයා වටා වලයාකාර ව සිටගෙන කවි හා කතන්දර ............ උගනිමු.

(20) පහත සඳහන් කතුවරුන් විසින් රචිත කෘති පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(01) කේ.ජයතිලක මහතා - A. උදයසිරි
(02) ඇස්.මහින්ද හිමි - B. වටු කිරිල්ලී හා තවත් කතා
(03) ඒ.පී.ගුණරත්න මහතා - C. පුංචි පැළේ ගස වෙනා

1. B , A , C
2. C , A , B
3. C , B , A
4. A , B , C

(ලකුණු 2 ×20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

II කොටස

- 1 හා 2 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- 3,4,5,6,7,ප්‍රශ්න අතරින් තුනක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) පන්ති කාමරයේ දී හෝ නිවසේදී හෝ ඔබ විසින් සකස් කළ කේවල පැවරුමක් ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ඔබ සකස් කළ කේවල පැවරුම සඳහා ඔබ යෙදූ නම කුමක් ද ? (ලකුණු 02)
2. මෙම පැවරුම සැකසීමේ දී තොරතුරු සපයා ගත් ක්‍රම 03 ක් ලියන්න. (ලකුණු 03)
3. පැවරුම සාර්ථකව නිම කිරීම සඳහා ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)
4. පැවරුම විධිමත්ව නිම කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)
5. තනිව ඔබ ක්‍රියාකාරකමෙහි යෙදෙන අවස්ථාවේ මතු වූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)
6. පැවරුම අලංකාරව නිම කිරීමෙන් අනතුරුව ඔබේ සිතට ඇති වූ සිතුවිල්ල කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

1. ගස් වැල් සුරකිමු.
2. වැඩිහිටියන් රැකබලා ගනිමු.
3. නිරෝගීකම හා පැරණි ලාංකීය ආහාර රටාව
4. "මට පියාපත් ලැබුණොත්.........."
5. නිමල් පවුලේ වැඩිමලා ය. ඔහුට නංගි කෙනෙක්ද මල්ලි කෙනෙක් ද සිටී.ඔවුහු ගමේ පන්සලේ අධ්‍යාපනය ලබති.නිමල්ගේ පියා වෘත්තියෙන් පොල් කඩන්නෙකි. හදිසියේ ම ඔහු පොල් ගසකින් වැටී ඔත්පල වෙයි.නිමල්ගේ මවද ඇඳුම රෝගයෙන් පසු වේ. එම නිසා ගෙදර කටයුතුවල බර කුඩා නිමල් මත පැටවේ.මෙම කරුණු ඇසුරින් නිමල්ගේ චරිත ප්‍රධාන කරගනිමින් නිර්මාණාත්මක කතාවක් ගොඩනගන්න.

(ලකුණු 14)

(03) මෙම වර්ෂයේ අවසන් වාර විභාගයෙන් පන්තියේ පළමුවෙනියා ලෙස ඔබ ලැබූ ජයග්‍රහණය පිළිබඳව විස්තර කරමින් දුර බැහැර රැකියාවක යෙදෙන ඔබගේ පියාට ලිපියක් ලියන්න.

**නැතහොත්,**

දිගු කාලයක් ඔබ සමඟ රැඳෙමින් ඔබගේ අධ්‍යාපන කටයුතු සඳහා මඟ පෙන්වූ ඔබගේ දයාබර ගුරුතුමිය රැකියාවෙන් විශ්‍රාම යාමට නියමිත ය.ඇයගේ විශ්‍රාම දිවිය ට සුබ පැතීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 10)

(04) පහත සඳහන් ප්‍රකාශයන් කා විසින් කා හට කියන ලද දැයි ලියා දක්වන්න.

1. "දරුවෙනි, තොප කළ දේ යහපතැ" (ලකුණු 02)
2. "සුරුට්ටු ද බොන්නේ, බුලත් ම ද කන්නේ" (ලකුණු 02)
3. "අම්මාව එක්ක යන්නේ මම" (ලකුණු 02)
4. "බොහොම ඉක්මනට ආවා නේද ?" (ලකුණු 02)
5. "එදා නම් තොපට පින් දෙන්නට ද මට සිහි මඳ වියැ" (ලකුණු 02)

(මුළු ලකුණු 2 × 5 = 10)

(05) පහත දැක්වෙන වාක්‍යය **ඒක වචන අතීත කාලයට** හරවා නැවත ලියන්න.

1. අපි පෙරහැර බැලීමට යමු. (ලකුණු 02)
2. කාන්තාවෝ මහන්සි වී වැඩ කරති. (ලකුණු 02)
3. ඔවුහු මුහුදු වෙරළේ සෙල්ලම් කරති. (ලකුණු 02)
4. තොපි හොඳින් පාඩම් කරහු (ලකුණු 02)
5. ගස් සුළඟට සෙලවෙයි (ලකුණු 02)

(මුළු ලකුණු 2 × 5 = 10)

(06) පෙළපොත ආශ්‍රිත දැනුමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. "සතුරු - මිතුරුව" පාඩම උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද ? (ලකුණු 02)
2. ඔබ පෙළ පොතෙහි සජීවී ගුවන් විදුලි වැඩසටහනක් ඇසුරින් සකස් වී ඇති පාඩම කුමක් ද ? (ලකුණු 02)
3. 'මග දිගට ජනකතා' කෘතියෙහි කතුවරයා කවරෙක් ද ? (ලකුණු 02)
4. 'ඇවිදින කොළයා' පාඩමට පාදක වූ කෘතිය කුමක් ද ? (ලකුණු 02)
5. 'බ්‍රෝහියර් දුටු ලංකාව' නැමැති කෘතියෙහි පරිවර්තකයා කවුරුන් ද ? (ලකුණු 02)

(මුළු ලකුණු 10)

(07) පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගල් කුළෙන් කුලට හැපෙනා
දුල් රිදී දියෙන් සොබනා
දිය කඳුරු ගලා බසිනා
නිල් දෙරණ වාසනාවන්.......

කෙළි මතින ඉපිල පිහිනා
නෙක දණ්ඩි පැටව් නටනා
දියකඩිති සිදී නොයනා
නිල් දෙරණ වාසනාවන්......

තුරු සිරස අඟ සිටිනා
සොඳ බටිති මලිති නොමිනා
යස මිහිරි සින්දු කියනා
නිල් දෙරණ වාසනාවන්.......

1. මෙම කවි පෙළෙහි තේමාව කුමක් ද ? (ලකුණු 02)
2. මෙම කවි පෙළෙහි ඇතුළත් ස්වභාවික සම්පත් මොනවා ද ? (ලකුණු 02)
3. මෙම කවි පෙළෙහි නිල් දෙරණ ලෙස හඳුන්වා ඇත්තේ කුමක් ද ? (ලකුණු 02)
4. පහත සඳහන් පදවල අර්ථය ලියන්න
   I තුරු සිරස II කෙළි මතින (ලකුණු 02)
5. පහත සඳහන් පද වලට සමාන පදය බැගින් ලියන්න.
   I පවන II කුළ (ලකුණු 02)

(ලකුණු 10)

(මුළු ලකුණු 60)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය
6 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 01 | 01 |
| 02 | 03 |
| 03 | 03 |
| 04 | 04 |
| 05 | 03 |
| 06 | 03 |
| 07 | 02 |
| 08 | 03 |
| 09 | 03 |
| 10 | 02 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 11 | 03 |
| 12 | 03 |
| 13 | නුවණ |
| 14 | පැල |
| 15 | 04 |
| 16 | 03 |
| 17 | 02 |
| 18 | 02 |
| 19 | සංගීත,හොඳින් |
| 20 | 02 |

(ලකුණු 2 ×20 = 40)

II කොටස

(01) 1. ශ්‍රී ලංකාවේ ආදිවාසීන් / රස පිරුණු පිරුළු කතා / රස මවන සොබාදම(ගැළපෙන සුදුසු නමක් සඳහා ලකුණු ලබා දෙන්න.)

2.
- අන්තර්ජාලයෙන්
- ගුරුතුමියගෙන් විමසීමෙන්
- සඟරා , පොතපත කියවීමෙන් (සුදු වැද්දා , වැදි ජන විත්ති )
- වැඩිහිටියන්ගෙන් විමසීම

3.
- පොතපත කියවා කරුණු සොයන්න.
- අන්තර්ජාලය භාවිතයෙන් අදාළ කරුණු හා රූප සටහන් ලබාගන්න
- අනු මාතෘකාවලට වෙන්කර කරුණු ගොනු කරන්න.
- ආකර්ෂණීය මාතෘකාවක් යොදන්න.

4.
- නිර්මාණශීලීත්වයට හුරුවීම.
- පැවරුමට අදාළ මාතෘකාව පිළිබඳ (වැදි ජනයා, ප්‍රස්ථා පිරුළු)බොහෝ කරුණු හා තොරතුරු පිළිබඳ අවබෝධය ලැබීම.
- පොත් කියවීමට හුරු වීම.

5.
- ඇතැම් කරුණු එකිනෙකට වෙනස් වීම.
- කරුණු සෙවීම හා ගොනු කර ගැනීමේ දී ගැටලු මතුවීම.
- ගැළපෙන පින්තූර සොයා ගැනීමේ අපහසුව ඇතිවීම

6.
- සිතට තෘප්තියක් ඇති වීම.
- මගේ හැකියාව පිළිබඳ ව අභිමානයක් ඇති වීම.
- සමස්ත නිර්මාණය පිළිබඳ ව සතුටක් ඇති වීම.

(ලකුණු16)

(02) 1. <u>ගස් වැල් සුරකිමු.</u>
- ගස් , වැල්වල වැදගත්කම
- පරිසරයට ලැබෙන සුන්දරත්වය
- ලැබෙන ආර්ථික ප්‍රයෝජන
- ගස් වැල් රැක ගැනීමේ වැදගත්කම
- ගස්වැල් රැක ගන්නා ආකාරය

2. <u>වැඩිහිටියන් රැකබලා ගනිමු.</u>
- වැඩිහිටියන් යනු කවුරුන්ද
- කළගුණ සැලකීමේ උතුම් ගුණය
- වැඩිහිටියන් රැකබලා ගත යුත්තේ ඇයි
- වැඩිහිටියන් සමාජයට සම්පතක් වන බව
- රැකබලා ගැනීම සඳහා නිවස තුළ සිදු කළ යුතු කාර්යයන්

3. <u>නිරෝගීකම හා පැරණි ලාංකීය ආහාර රටාව</u>
- පැරණි අපේ ආහාර රටාවේ විවිධත්වය
- ආහාරයේ තිබූ විචිත්‍ර බව
- අපේ රටට ආවේණික වූ ආහාර හා රස කැවිලි
- අපේ ආහාර රටාවේ වැදගත් අංශයක් වූ ආහාර පරිරක්ෂණය
- ස්වභාව ධර්මය හා බැඳුණු නිරෝගී ආහාර රටාව
- එම රටාවන් ක්‍රමයෙන් ගිලිහී ගිය බව හා නැවත ගොඩනැගීමේ අවශ්‍යතාව

4. "<u>මට පියාපත් ලැබුනොත්.....</u>"
- කුරුල්ලන්ගේ නිදහස පිළිබඳ අවබෝධය
- පියාපත් ලබා ඉගිලෙන විට දකින සුන්දර දසුන්
- පියාපත් ලැබීමෙන් ඉෂ්ට කර ගත හැකි අරමුණු
- පියාපත් ලැබීමෙන් වර්ධනය කරගත හැකි ගුණාංග

5. මේ සඳහා සුදුසු මාතෘකාවක් යොදා තිබිය යුතුය.
- නිමල් තම පියා විසින් ඉටු කරන ලද බොහෝ දේ ඉටු කිරීමට දරණ උත්සාහය
- ඉගෙනීමට දක්ෂ නංගීට / මල්ලීට ඉගැන්වීමට ගන්නා වෙහෙස
- පවුල වෙනුවෙන් රැකියාවකට යාමට දරණ උත්සාහය
- අවසානයේ කඳුළු අතරින් නිමල්ගේ සිහින සැබෑ වන අයුරු

(කතාවේ සිදුවීම් අතර මනා සම්බන්ධයක් තිබිය යුතුය.)

ලකුණු විග්‍රහය මුළු ලකුණු 14 යි.

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය | 03 යි. |
| 2. | (සංවිධානය,නිර්මාණාත්මක භාවය,ප්‍රකාශන හැකියාව) | 08 යි. |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | 03 යි. |

(01) සාරවත්භාවය
තේමාවට අදාළ බව
වචන 150 ට සමීප ව පැවතීම
කරුණුවල සාරවත් බව සැලකිල්ලට ගත යුතු වේ. (ලකුණු 03)

(02) ප්‍රකාශන හැකියාව
කරුණු සංවිධානය
නිර්මාණාත්මක භාෂාව භාවිතය පිළිබඳ ව සැලකිලිමත් විය යුතුය. (ලකුණු 08)

(03) ඡේද බෙදා ලිවීම
වියරණ , අත් අකුරු , විරාම ලක්ෂණ
පද වෙන් කොට ලිවීම සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ. (ලකුණු 03)

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බිංදුව නොයොදන්න. සමස්තයක් ලෙස ලකුණු 02- 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න.

(03) පෞද්ගලික ලිපි

යවන්නාගේ ලිපිනය
දිනය

ආශිර්වාදය !

ආමන්ත්‍රණය,

අන්තර්ගත කරුණු
- තාත්තාගේ තොරතුරු සැපදුක විමසීම.
- තමා ඇතුළු පවුලේ සැම සුවෙන් සිටින බව දැන්වීම.
- තම විභාග ජයග්‍රහණය පිළිබඳ ව සතුටින් දැක්වීම.
- තව තවත් ලකුණු ඉහළ දමා ගැනීමට උත්සාහ වන බව
- තාත්තාට නිවාඩු ලැබුණු විගස ගෙදර පැමිණෙන ලෙස කරන ඉල්ලීම
- තාත්තාට දෙවියන්ගේ ආශිර්වාදය පැතීම

අවසානය

1. ආකෘතිය - 04 යි
2. අන්තර්ගතය - 04 යි
3. ශිල්පීය දක්ෂතා - 02 යි

1. ආකෘතිය - (ලකුණු 04)
- යවන්නාගේ ලිපිනය හා දිනය ලකුණු 01 යි
- ආශිර්වාදය ලකුණු 01 යි
- ආමන්ත්‍රණය ලකුණු 01 යි
- අවසානය ලකුණු 01 යි

2. අන්තර්ගතය :- පැහැදිලි ව කරුණු දක්වා ඇති විට උපරිම ලකුණු ලබා දෙන්න. නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති විට ලකුණු ලබාදීමේ දී සැලකිලිමත් වන්න.

3. ශිල්පීය දක්ෂතා :- විරාම ලක්ෂණ ,ඡේද බෙදීම, අත් අකුරු, නිවැරදි පද බෙදීම්, ව්‍යාකරණ දැනුම ආදිය පිළිබඳ සැලකිලිමත් වන්න

නැතහොත්,

<u>සුභ පැතුම් පත</u>

1. නිර්මාණශිලී ආකෘතිය - ලකුණු 03යි
2. අන්තර්ගතය - ලකුණු 05යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02යි

මුළු ලකුණු 10 යි.

<u>අන්තර්ගතය</u> (ලකුණු 05යි)

1. සුභ පැතීමේ නිමිත්ත
2. ආකර්ෂණීය භාෂා ශෛලියකින් යුතු බව.
3. හෘදයාංගම හා සංක්ෂිප්ත බව
4. කා විසින් කවුරුන් වෙත ද යන්න පැහැදිලි ව සඳහන් විය යුතුය.

<u>ශිල්පීය දක්ෂතා</u> (ලකුණු 05යි)

1. නිවැරදි අක්ෂර වින්‍යාසය
2. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය
3. පැහැදිලි අත්අකුරු
4. විරාම ලක්ෂණ
5. නිවැරදි පද බෙදීම අනුව ලකුණු පිරිනමන්න (ලකුණු 10 යි)

(04)
1. බෝසත් වඳුරා විසින් වානරයන් (නලපාන ජාතකය )
2. නරියා විසින් ගමරාළට (නලපාන ජාතකය - නරිබෑනා නාට්‍යය)
3. ශරත් විසින් පියදාසට (ක්‍රියා පද හා එහි ප්‍රභේද )
4. විමලා විසින් සමරවික්‍රමට (ක්‍රියා පද හා එහි ප්‍රභේද)
5. අලියා විසින් තමාගේ පාදයට (අලි උවදුර)

(ලකුණු 10 යි)

(05)
1. මම පෙරහැර බැලීමට ගියෙමි
2. කාන්තාව මහන්සි වී වැඩ කළා ය.
3. ඔහු මුහුදු වෙරළේ සෙල්ලම් කළේ ය.
4. තෝ හොඳින් පාඩම් කළෙහි.
5. ගස සුළඟට සෙළවිණි. (ලකුණු 10 යි)

(06)
1. ප්‍රබන්ධෝපදේශය
2. සූරිය උදා වී යළි සැඟවුණිදෙ
3. ඩී.පී.වික්‍රමසිංහ මහතා
4. විද්‍යා විනෝද කතා
5. අභය හේවාවසම් මහතා

(07)
1. ශ්‍රී ලංකාවේ සුන්දරත්වය අභිමානයෙන් වර්ණනා කිරීම.
2. ලිය මඩුලු ,දිය කඳුරු ,දිය කඩිති ,තුරු, ගල්කුළු
3. මහ පොළොව
   ගස් වැල් වලින් සරුසාර වූ කොළ පාටින් වැසුණු භූමිය යන අදහසින් නිල් දෙරණ ලෙස හඳුන්වයි.
4. තුරු සිරස - ගස් මුදුන්
   කෙළි මතින - ක්‍රීඩාවට ඇඩි ආශාවෙන්
5. පවන - සුළඟ , නල
   කුළ - කන්ද , පර්වතය

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..